# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1934/41 - 2015 ඔක්තෝබර් මස 02 වැනි සිකුරාදා - 2015.10.02

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 975 දරන සුරාබදු නිවේදනය

**ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සඳහා වූ සුරා බද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2015 ඔක්තෝබර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි -

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් රුපියල් එක් දහස් පන්සිය අනූපහක් (රු.1,595.00) වන බද්දක් අය විය යුතු යැයි ද, එසේ වුව ද, ඉහත කී නිෂ්පාදිත අරක්කු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද, එකී බද්ද අය නොකළ යුතු යැයි ද,

(2) 2014 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 1885/44 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 969 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

10 - 761/1

1A - PG 2625 — 506 (2015/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සුරාබදු ආඥාපනත

### අංක 976 දරන සුරාබදු නිවේදනය

**මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සඳහා වූ සුරා බද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2015 ඔක්තෝබර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි -

(1) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ, ''විදේශීය" ස්ප්‍රීතු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් රුපියල් එක් දහස් අටසිය හැටක් (රු.1,860.00) වන බද්දක් අය විය යුතු යැයි ද, එසේ වුවත් ඉහත කී මෙරට සෑදූ ''විදේශීය" ස්ප්‍රීතු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර හෝ ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද, එකී බද්ද අය නොවිය යුතු යැයි ද,

(2) 2014 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 1885/44 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 970 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

10 - 761/2

---

## සුරාබදු ආඥාපනත

### අංක 977 දරන සුරාබදු නිවේදනය

**ධාන්‍ය මත්පැන් සඳහා වූ සුරා බද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2015 ඔක්තෝබර් 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි -

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහකට (5%) වඩා අඩු වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකටම රුපියල් එකසිය අනූවක් (රු.190.00) වන බද්දක් පැන විය යුතු යැයි ද,

(2) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහක් (5%) සහ ඊට වැඩි වන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකටම රුපියල් දෙසිය හතලිස් පහක් (රු.245.00) වන බද්දක් පැන විය යුතු යැයි ද,

(3) යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද ඒ මත්පැන් වර්ගයෙහි යම් ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද,

(4) 2014 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 1885/44 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරනු ලැබූ අංක 971 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

10 - 761/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.